


# End of the World is now in October 2011
# ලෝක විනාශය ඔක්තෝබර් වලට කල්යයි

Evangelical broadcaster -preacher
Harold Camping

In January this year, Harold Camping, an 89-year-old self-styled expert in the scriptures, who lives in northern California told his followers that he had found the exact day of the world ending - May 21, 2011. An apocalyptic storm would wipe out all but a hardcore of believers, Camping said.

His followers immediately spread the news all over the USA. A lot of people shudd - ered, some ran to be with their families, some spend their money like never before.


But when this fateful day dawned, and nothing unusual happened, people breathed a sigh of relief. Camping was not there to answer. Then the news came that he was recovering from a heart-attack. He apologised for being wrong at that date but gave another date for the world's end. "This time it's certain and final " he says. **That day is 21 October 2011.**

**බ**යිබල් ධර්මාචාර්යවරයෙකු සහ ගුවන්විදුලි නාලිකාවක්ද හිමි 89 වියැති හැරල්ඩ් කැම්පිං ඇමරිකාවේ කැලිෆෝනියාවේ වෙසේ. දැනට වසර ගණනක සිට ඔහු වරින්වර ලෝකය නිසැකවම විනාශ වන දිනයක් ගැන කියයි. මේ වසරේ මුල දී ඔහු ප්‍රකාශ කළේ මැයි මාසයේ 21 වන දින දැවැන්ත කුණාටුවක් පැමිණ ලෝකය මුළුමනින්ම විනාශ වන බවත් දෙවියන්ට භක්තිය ඇති අත ලොස්සක් පමණක් ඉතිරිවන බවත් ය. ඇතැම් අය එය විකාර කතා වක් ලෙස සිතූ අතර විස්වාස කළ බොහෝ දෙන වහා සිය ගෙවල්වල තම පවුලේ අය සමග අවසාන කාලය ගතකරන්නට සිතූහ.

මැයි 21 වන දිනට පහන් විය. එහෙත් අනතුරුදායක කිසිවක් සිදුවුණේ නැත. අනාවැකිය බොරුවක් විය. හැරල්ඩ් කැම්පිං වැරදීම ගැන සමාව අයැදූ අතර එදා ඔහුට හෘදයාබාධයක්ද වැළඳුණ බව පසුව අසන්නට ලැබිණ. එහෙත් ඔහු අනාවැකි කීම අත්හැර නැත. කැම්පිං දැන් කියන්නේ ලෝක විනාශය නිසැකවම මේ ඉදිරියට එන ඔක්තෝබර් 21 වන දින සිදුවන බවයි.

## ඇත්ත කෙටි කතාව

## පිය සමර



**ගි**ය මාසේ පියවරුන්ගේ දිනයේදි දියණියන් දෙදෙනා මගේ ගුණ ගැන ලියලා සැමරුම් පතක් තෑගිත් එක්ක දුන්න වෙලාවෙ මට සතුටක් වගේම දුකකුත් ඇතිවුනයි කිව්වොත් එය වැරදි නැහැ. සතුට, මගේ දරුවන් මා ගැන තියෙන හැඟීම පිළිබඳවයි. දුක, අපේ තාත්තට මම කවදාවත් එහෙම දෙයක් දීලා, කරලා නැහැ නේද කියන කාරණේ මතක් වෙලා. අපි ලංකාවෙ ඉන්න කොට මොන ෆාදර්ස් ඩේ ද ? ඒවා ගැන අපි හීනෙකින් වත් දැනං හිටියෙ නැහැනේ. ඒත් ඇයි තාත්ගෙ උපන්දිනයට මම කාඩ් එකක් වත් දුන්නෙ නැත්තෙ? ඇයි තාත්තට මම ආදරෙයි කියලා කිව්වෙ නැත්තෙ? මට ඒ ගැන හිතෙන කොට හිතට මහ බරක් දැනෙනවා. අම්මට වුනත් ආදරණීය අම්මෙ කියලා ලියුම් ලියලා තිබුණට අම්මට මම ආදරෙයි කියලා කිව්වා කියලා මතක නැහැ. පොඩි කාලෙදි නම් අම්මලා අහන කොට කියන්න ඇති. අපේ ආදරේ තිබුණේ හිත්වල විතරයි.

මම මොන්ටිසෝරියට ගියේ කොළඹ මියුසියස් විද්‍යාලයට. මම ඒ කාලෙ ගැහැණු ළමයෙක් වෙලා හිටියා කියලා හිතන්න එපා. එතකොට මොන්ටිසෝරියට ගැහැණු පිරිමි දෙගොල්ලම ගන්නවා. මට මතකයි බණ්ඩාර නායක මහත්තෙයට වෙඩි තියපු දවසෙ තිබුණු කලබලය. තාත්ත ඇවිල්ලා මාව ඉස්කෝලෙන් අරන් ගියා. බණ්ඩාරනායක මිනීමැරුමෙ පින්තූර ගත්තෙ අපේ තාත්තා. තාත්තා තමයි ඒ කාලෙ පොලීසියේ ඡායාරූප අංශය භාරව හිටියෙ.

මොන්ටිසෝරියෙ sport meet එක තිබුණා. මට අවුරුදු පහක් විතර ඇති. ඉහළ පන්තිවල අක්කලා ඇවිල්ලා ඇහුවා බනිස් කෑමෙ තරඟෙට ඉන්න කැමති කවුද කියලා. මමත් අත ඉස්සුවා. එදා හවස මම තාත්තා ගෙදර එනකල් ඉඳලා කිව්වා, " හෙට අපේ ස්පෝට් මීට් එක...... මම බනිස් කෑමෙ තර ඟෙට ඉන්නවා,......ඉඳලා පළවෙනියා වෙනවා ......තාත්තා එන්න පින්තූර ගන්න.....". කියලා. ගෙදර හැමෝම, අක්කලා, අයියලා, ඔක්කොම බක බක ගාලා හිනාවුණා. ඒත් මට මතකයි තාත්තා විතරක් හිනාවුණේ නෑ. "හොඳයි මම එන්නම් " කියලා කිව්වා.

පහුවෙන්දා තාත්තා ආවෙ නෑ. තාත්තගෙ ඇසිස්ටන්ට් කෙනෙක් පින්තූර ගන්න එවලා තිබුණා. අර කිව්වා වගේම එදා මම බනිස් කෑමේ තරඟයෙන් පළවෙනි යා වුණා. මට පස්සෙ කාලෙක තමයි ප්‍රත්‍යක්ෂ වුණේ එදා අවුරුදු පහේදි තාත්තා මට මොනතරම් ධෛර්යයක් දීලා තියනවද කියලා.

මම තර්ස්ටන් විද්‍යාලයේ රගර් කණ්ඩායමේ නායකයා වුණා. වයස අවුරුදු 14 න් පහළ 16 න් පහළ ක්‍රිකට් සෙල්ලම් කළා. ඒත් කිසිම දවසක අපේ තාත්තා ආවෙ නැහැ මම සෙල්ලම් කරපු තරඟයක් බලන්න. මට ඒ දවස්වල ඒ ගැන එච්චර හැඟීමක් තිබුණේ නැහැ. ඒත් සමහර ක්‍රීඩකයන්ගෙ අම්මලා තාත්තලා නොකඩවා තරඟ බලන්න ආවා. මම රගර් කණ්ඩායමේ නායකයා වෙච්ච වෙලාවෙ එක තාත්තා කෙනෙක් අපේ කණ්ඩායම භාර ගුරුතුමාට යෝජනා කරලා තිබුණා, එයාගෙ පුතාට නායකත් වය දෙනව නම් මුළු කණ්ඩායමටම රගර් ජර්සි සහ දිග මේස් (stockings) අරන් දෙනවා කියලා. සමහර තාත්තලා එහෙමයි. නමුත් ඒ කාලෙ ගුරුවරු කවදාවත් අල්ලස් වලට නැමුණේ නැහැ.

මම 1974 තර්ස්ටන් විද්‍යාලයෙ ප්‍රධාන ශිෂ්‍ය නායකයා වුණා. විද්‍යාලීය සඟරාවෙ සංස්කාරක වුණා. නිවාස මළල ක්‍රීඩා නායකයා වුණා. තාත්තා මාව ඉස්කෝලෙ දාන්න ගිය දවසට පස්සෙ ඒ පැත්ත පලාතෙ ආවෙ නෑ. ඒ දවස්වල තාත්තලා අම්මලාගෙ හැටි එහෙමයි. පහු කාලයේ ගුරුවරුන්ට කේක් හදාගෙන, තෑගි දීගෙන තමන්ගෙ ළමයි ඉදිරියට ගේන්න දෙමා පියන් උත්සාහ කරන එක සාමාන්‍ය දෙයක් වුණා.

කොහොම හරි මගේ පම්පෝරිය කියන්න සිද්ධ වුණේ තාත්තා ගැන මත කය අවදිවුණ නිසා. අපි දඟකරන කොටත්, හොඳක් කරන කොටත්, ඉගෙන ගන්න කොටත්, තාත්තලා අම්මලා එක වගේම උපේක්ෂාවෙන් අපි දිහා බලන් ඉඳලා අපේ දියුණුව ප්‍රාර්ථනා කරන්න ඇති.

තාත්තා නැතිවෙලා දැන් අවුරුදු විසි හතක් වෙනවා. අම්මා නැතිවුණේ මාස දෙකකට ඉස්සෙල්ලා. ඔවුන්ගෙ ආදරය අපිට කිය කිය හිටියෙ නැතුවට මොනතරම් උසට ගැඹුරට තියෙන්න ඇද්ද කියලා හිතෙන්නෙ අපි අපේ දරුවන්ට තියන ආදරය ගැන කල්පනාකරන කොට.

මට නං කවදාවත් කියන්න බැරිවුණා " තාත්තෙ මං ඔයාට ආදරෙයි " " අම්මෙ මං ඔයාට ආදරෙයි " කියලා. දැන් ඉතිං ඒව ගැන කතාකරලා වැඩක් නැති වුනත්, මං හිතනවා මෙය කියවන ඔබ නම් එහෙම කරාවි කියලා.

**නීතිඥ**
**අනුර හෑගොඩ**



## සනත්ගේ සමුගැනීම




**දැ**නට සති දෙකකට පෙර ලන්ඩනයේ ඕවල් ක්‍රීඩාංගනයෙ එංගලන්තය සහ ශ්‍රීලංකාව අතර ප්‍රථම එක් දින ක්‍රිකට් තරඟය (One Day International) පැවැත්තුවා. එදා ලංකා කණ්ඩායමට අපේ සම්භාවනීය පිතිකරුවෙකු වන සනත් ජයසූරියත් ඇතුළත් කර තිබුණා. ඒ සනත්ගෙ අවසාන, එමෙන්ම ක්‍රිකට් වලින් සමුගැනීමේ තරඟය. සනත් ට දැනට වයස **42** ක් සම්පූර්ණ වෙනවා. මං හිතන්නෙ නැහැ ඒ වයසෙ වෙන කවුරුවත් අද ජාත්‍යන්තර ක්‍රිකට් කණ්ඩායමක ඉන්නවයි කියලා.

සනත්ගෙ ක්‍රිකට් ජීවිතය දිහා බලන කොට පුදුම හිතෙන දේවල් මේ එතරම් උස මහත නැති පුංචි මිනිහා තනියම කරලා තියෙනවා. ඒ සංඛ්‍යා ලේඛන කියවන්නත් ආසයි.

බෝල 17 කින් ගැසූ වේගවත්ම ලකුණු 50
බෝල 95 කින් ගැසූ වේගවත්ම ලකුණු 100 සහ ලකුණු 150
ඔහු 4 වරක් ලකුණු 150 ට වඩා රැස්කරලා තියනවා.
ලකුණු 340 ක් රැස්කළ මුල්ම ශ්‍රීලාංකිකයා සනත් ජයසූරිය. ඒ ඉන්දියාවට එරෙහිව. (පසුව ඒ වාර්තාව මහේල කැඩුවා දකුණු අප්‍රිකාවට එරෙහිව ලකුණු 374 ක් ගහලා.)
එක්දින තරඟ වලදී ශතක 28 ක් ( 28 Centuries in ODI )
එක් දින තරඟවලදී සනත් ලකුණු 13,000 කට වඩා රැස්කරලා තියනවා. ඒ වගේම විකට් 400 කට වඩා අරගෙන තියනවා. ක්‍රිකට් ලෝකයේ ඔහුගේ හපන්කම් තව බොහෝ තිබෙනවා.

1996 වර්ල්ඩ් කප් ක්‍රිකට් ලංකාවෙ කාටත් හොඳට මතකයි. එතකොට කොටි ත්‍රස්තවාදී යුද්ධෙ. හැමදාම වගේ බෝම්බ පිපි- රෙනවා. ලංකාවෙ කළබල. ඔස්ට්‍රේලියාවයි වෙස්ට් ඉන්ඩීස් කණ්ඩායමයි කොළඹට ආවෙත් නැහැ. එන්න බැහැයි කිව්වා. මොන ක්‍රිකට්ද? ක්‍රිකට් නෙවෙයි අපි හැම අතින්ම දුර්වල වෙලා, කොන්වෙලා, පාන් කියාගන්න බැරුව හිටියෙ. නමුත් අපේ ක්‍රීඩකයින් අතර පුදුම ශක්තියක්, ධෛර්යයක්, විශ්වාසයක් හා එකමුතුකමක් එදා තිබුණා. ඒ නිසාම කිසි කෙනෙක් හීනෙන්වත් නොසිතූ ලෝක කුසලාන අපේ ලංකාව එදා දිනුවා.

ඒ 1996 වර්ල්ඩ් කප් තරඟ වලදි තමයි ලෝකයා දැනගත්තෙ සනත් ජයසූරිය කෙනෙක් ගැන. ඒ වගේ ක්‍රිකට් ක්‍රීඩකයෙක් ඉන් පෙර දැකලා නැතුව වගේ තමයි පිටරට පත්තර වල, බීබීසී ක්‍රීඩා අංශයෙ, ඒ වගේම සම්භාවනීය විස්ඩන් ක්‍රිකට් සඟරාවෙ සඳහන් කරලා තිබුණේ. මගේ ළඟ තවමත් තියනවා එදා **UK Times** පත්තරේ ක්‍රීඩා පිටුව. ඒකෙ කීර්තිමත් ක්‍රිකට් විචාරකයෙකු වන ක්‍රිස්ටෝපර් මාටින් ජෙන්කින්ස් මෙන්න මෙහෙම ලියලා තියනවා.

" Jayasuriya has left an indelible mark on One Day Cricket. He, along with Kaluwitharana, transformed and raised the traditional batting style into new heights. "

(ජයසූරිය එක් දින ක්‍රිකට් ක්‍රීඩාවේ නොමැකෙන, කිසිදා අමතක නොවන සටහනක් තබා ඇත. ඔහු කලුවිතාරණ සමග එක්ව මෙතක් පැවති පිති හරඹය නවතම උස් තලයකට නැංවීය.)

ලෝක ක්‍රිකට් ක්‍රීඩාවට ජයසූරිය වගේ අයගෙන් ලැබුණේ ඉන් පෙර නොතිබුණු දීප්තියක්. ලෝක මට්ටමේ ක්‍රීඩකයින් අපට ඉස්සර හිටියෙ නැහැ. ඒත් අද අපට ඉන්නවා. එයට මුල පිරු- වෙ අර්ජුණ සනත් මුරලි වාස් වැනි අය. අප රටට ලෝක ගෞරවයක් මෑත කාලයේදී ලැබුණා නම් ඒ ඔවුන් නිසා. අපේ රටේ ජනතාව පහුගිය අවුරුදු 30 ක් පුරා කුරිරු ත්‍රස්තවාදෙන් දුක් විඳිද්දී එය අමතක කරලා හිත සැනසෙන හිනාවක් අපේ මුවගට ගෙනාවෙ සනත් වගේ අයගෙ සුපිරි පිති හරඹ.

2006 එංගලන්ත සංචාරයෙදි ශතක 2 ක් (එකක් 154ක්) ගහපු සනත් ගිය මාසෙ 28 වෙනදා ලන්ඩනයේ ඕවල් පිටියේදී ඔහුගේ අවසාන තරඟයේදි ලකුණු 2 කට දැවී ගියා. ඔහු පිටියෙ වටේට අත වනමින් ආපහු යද්දි බීබීසී රේඩියෝ විස්තර ප්‍රචාරක ජොනතන් ඇග්නිව් කණගාටු ස්වරයෙන් මෙහෙම කිව්වා:

" Never mind old chap, you are still a hero to millions of cricket fans world over. It was a pleasure to see you play. Thank you !" මට කියන්න ඇත්තෙත් සනත් එපමණයි.

♦ වෙලේගෙදර රාළ London